

# කෘෂිකාර්මික පලදාවර්ධන කමිටු හා ප්‍රාදේශීය සංවර්ධනය

(කෘෂිකාර්මික පලදාවර්ධන කමිටු ප්‍රදේශයේ සංවර්ධනය සඳහා කටයුතු කරන ආකාරය පිළිබඳව ගොවි ජනතාව පාඨක පිරිස වෙත අවබෝධයක් ලබා දීම සඳහා ලිපි පෙළක් ලිවීමට අදහස් කළෙමු. ප්‍රදේශයේ දියුණුව සඳහා මෙම කමිටු ගන්නා ක්‍රියා මාර්ග, ගොවි කාරක සභා සහ පලද වර්ධන කමිටු එකමුතුව තම බල ප්‍රදේශය දියුණු කිරීමට අත හිත දෙන ආකාරය පිළිබඳව කරුණු සොයා බලා ලියන ලිපි මාලාවක පළමුවැන්න වන මෙම ලිපියෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පොතුහැර කෘෂිකාර්මික පලදා වර්ධන කමිටුව මෙතෙක් ප්‍රදේශයේ සංවර්ධනය උදෙසා වැඩ කර ඇති ආකාරය විස්තර කෙරේ.)

ගොවීන් 3,000 යි;
යල මහ දෙකට වැහි දියෙන් වැඩ කරන කුඹුරු ඉඩම් අක්කර 3,200 යි;
ගොඩ ඉඩම් අක්කර 9,000 යි;
ග්‍රාම සේවක කොට්ඨාශ 14 යි;
ගොවි කාරක සභා කොට්ඨාශ 14 යි.

පොතුහැර පලදවර්ධන කමිටුවට වැඩ කටයුතු සිදු කිරීමට ඇත්තේ ඉහතින් දැක් වූ ගොවීන් සංඛ්‍යාවක් හා ඉඩම් ප්‍රමාණයක් ඇති ප්‍රදේශයක් තුළයි. මෙතරම් ප්‍රමාණයක ඉඩකඩම් සහ මිනිස් සම්පත් අයිති වන ප්‍රදේශයක ගොවිතැන් කටයුතු සාර්ථක ලෙස ඉටු කිරීමට මෙම පලද වර්ධන කමිටුව මෙතෙක් ගෙන ඇති පියවර ගැන සොයා බැලීමට අපි අදහස් කළා.

(අ) ගොවීන්ට අවශ්‍ය ණය පහසුකම් ලබා දීම;


(ආ) කෘමිනාශක ද්‍රව්‍ය, පෝර ආදී යෙදවුම් සපයා දීම;

(ඇ) ගොවි කාරක සභා සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම;

(ඈ) කමිටුවේ වැඩ කටයුතු සඳහා අවශ්‍ය මූලධනය උපයා ගැනීම;

(ඉ) ගොවි ජනතාවගේ විශ්වාසය හා හොඳහිත දිනා ගැනීම;

ආදී කරුණු සම්බන්ධයෙන් පොතුහැර කෘෂිකාර්මික පලද වර්ධන කමිටුව පියවර කිහිපයක් ඉදිරියට තබා ඇති බව එම කමිටුවේ වැඩ කටයුතු සම්බන්ධයෙන් සමිතියේ සාමාජිකයින් සමඟ අප කළ සාකච්ඡාවේදී පැහැදිලි වුනා.



### ගොවීන්ට අවශ්‍ය ණය පහසුකම් ලබා දීම

1974 ජනවාරි මාසයේ ආරම්භ කළ පොතුහැර කෘෂිකාර්මික පලදවර්ධන කමිටුව ප්‍රථමයෙන්ම සිදු කළ වැදගත් රාජකාරිය එම බල ප්‍රදේශය තුළ සිටින ගොවීන් 1,000ක් පමණ දෙනා වෙත ගොවි හැඳුනුම්පත් නිකුත් කිරීමට කටයුතු ආරම්භ කිරීමයි. මේ නිසාම පසුගිය යල් කන්නය තුළ ණය පහසුකම් අවශ්‍ය ගොවීන් 125 කට පමණ රු. 87,000/- කට ආසන්න ණය මුදලක් ලබා දීමට පලදවර්ධන කමිටුවට පුළුවන් වුනා. මෙම ණය මුදලින් රු. 8,000/- ක් හැරෙන්නට අනෙක් සියළුම මුදල් පියවා ගැනීමට පලදවර්ධන කමිටුව සමත් වුනේ, ගොවි කාරක සභා මගින් ප්‍රදේශයේ ගොවි ජනතාවගේ හොඳ හිත දිනා ගැනීමට කටයුතු කර තිබුණු නිසයි. මේ ණය මුදල් ආපසු පියවා ගැනීමේදී ගොවි කාරක සභා වල සාමාජිකයින් ඉතාමත් උනන්දුවක් දක්වා ණය මුදල් ගොවීන්ගෙන් ආපසු ලබා ගැනීමට පලදවර්ධන කමිටුවට උපකාර කළ බව, හොඳින් පැහැදිලිය. කලට වේලාවට ණය මුදල් ගොවි මහතුන්ට දීලා, එම ණය මුදල් ගොවිතැන් කටයුතු වලට යොදන්නේදැයි ටිකක් සොයා බලා කටයුතු කළොත්, අස්වැන්න රැස් කරන කොට ණය ආපසු පියවා ගැනීම එතරම් අපහසු නොවන බව පොතුහැර පලදවර්ධන කමිටුවේ සභාපතිතුමාගේ අදහසයි.

### කෘමිණාශක ද්‍රව්‍ය, පෝර ආදී යෙදවුම් සපයාදීම

පසුගිය යල මහ කන්න දෙකට රු. 44,000/- පමණ වටිනා කෘමිනාශක ද්‍රව්‍යය ගොවීන්ට ලබා දීමට පොතුහැර පලද වර්ධන කමිටුවට පුළුවන් වුනා. පෞද්ගලික සමාගම්කින් ලැබෙන 5% ක කොමිස් මුදල පමණක් පලදවර්ධන කමිටුවේ ආදායම හැටියට තබා ගෙන මේ කෘමිනාශක ද්‍රව්‍ය ගොවීන් අතර බෙදදීමට පලද වර්ධන කමිටුව කටයුතු කළා. 1975 මහ කන්නයේ දී රුපියල් දෙලක්ෂයක් පමණ වටිනා පෝර හොණ්ඩර 2,500ක් පමණකුත්, යල කන්නයේදීත් එතරම්ම වටිනා පෝර ප්‍රමාණයකුත් ගොවීන් අතර බෙදදීමට මේ පලදවර්ධන කමිටුව කටයුතු කළා. මේ වගේ වැඩ කටයුතු සාර්ථක ලෙස ඉටු කළ නිසාම ප්‍රදේශයේ ගොවි ජනතාවගේ සුභ සිද්ධිය සඳහා පෝර ගබඩාවක් ඉදි කිරීමටත් දැන් අත්තිවාරම් යොදා ඇති බව පලද වර්ධන කමිටුවේ සභාපති මහතා ප්‍රකාශ කළා. ආය

තනයක් හැටියට පලද වර්ධන කමිටුව සවිමත් තත්ත්වයකට ගෙන ඒමට නම් ගොවීන්ගේ ජීවන තත්වය දියුණු කිරීම ඉතාමත් වැදගත් ලෙස සළකන පොතුහැර පලදවර්ධන කමිටුව, මුලින්ම කටයුතු කළේ ගොවි ජන තාවගේ ආදායම වැඩිකරලීමටයි.

**ගොවි කාරක සභා සමඟ සහයෝගයෙන් කටයුතු කිරීම**

ගොවි කාරක සභා සමඟ පලදවර්ධන කමිටුව ඉතාමත් කිට්ටු සම්බන්ධතා වයකින් කටයුතු කරන බව ප්‍රකාශ කළ පොතුහැර පලදවර්ධන කමිටුවේ සභාපති මහතා වැඩිදුරටත් මෙහෙම කිව්වා. ''අපේ පලද වර්ධන කමිටුවට ගොවි-කාරක සභා 14 ක් අයිති වෙනවා. මේ එක එක ගොවි කාරක සභාවක සාමාජිකයෙකුට එක් ප්‍රදේශයක් සීමා කරල ඒ ප්‍රදේශයේ ගොවි තැන් කටයුතු දියුණුවට අපේ කමිටුව සමග සහයෝගයෙන් කටයුතු කරන්න ඔවුන්ට ඉඩ සලසල තියෙනව. ඒ වගේම පලද වර්ධන කමිටුවේ සාමාජිකයන් අතරත් එක එක ප්‍රදේශය නියම කර ගෙන ඒ ප්‍රදේශයේ වැඩ කට-යුතු වලට වග කියන්න එක සාමාජිකයෙකුට පවරනව. කමිටුවේ සභාපති හැටියට මමත් අනෙක් සාමාජිකයිනුත් නිතර නිතර ගොවි කාරක සභා රැස්වීම්වලට සහභාගි වෙනව වගේම ගොවිකාරක සභාවල සභාපතිවරු මාසයකට වරක් කෘෂි සේවා මධ්‍යස්ථානයට රැස්වෙලා සාකච්ඡා කරනව. මේ විධියට කට යුතු කරන කොට ගොවි කාරක සභාවත් පලද වර්ධන කමිටුවත් අතර හොඳ සම්බන්ධතාව යක් පවතිනවා වගේම ඒක් එක් සාමාජික යන්ට එක් එක් ප්‍රදේශ නියම කරල තියෙන හින්ද ඒ අය තමන්ට සීමිත ප්‍රදේශය හොඳින් දියුණු කරගන්නත් උත්සාහ කරනවා''.

**කමිටුවේ වැඩ කටයුතු සඳහා අවශ්‍ය මූලධනය උපයා ගැනීම**

ගොවීන් හට පෝර හා කෘමි නාශක ද්‍රව්‍ය ආදිය බෙද දීමෙන් රු. 15,000/- ක පමණ ආදායමක් පලද වර්ධන කමිටුවට ලැබුණා. ඒ ආදායමින් වැඩි හරියක් ඔවුන්ට ලැබුනේ පෞද්ගලික සමාගමකින් ගත් පෝරවලට ලැබුණු කොමිස් මුදලකිනුයි. කමිටුවේ මුදල් යොදවා බලවේග ඉසින යන්ත්‍ර 6 ක් මිළදී ගෙන තියෙනව. ඒවා කුලියට දීමෙන් එක් අක්කරයකට රු. 9/- බැගින් කුලියට ලබා ගැනීමට මේ පලදවර්ධන කමිටුවට පුළුවන් වෙලා තියෙනවා. ඒ වගේම අහල් 3 වතුර පොම්පයකුත් පලදවර්ධන කමිටුව සතු නිසා එමගිනුත් මුදල් උපයා ගැනීමට කමිටුවට පිළිවනි. ලංකා බැංකුව සම්පූර්ණයෙන් ණය මුදල ලබා දී රු. 80,000/- ක් පමණ වටිනා රෝද හතරේ ට්‍රැක්ටරයක් ද පලද වර්ධන කමිටුවට සපයා දී තිබෙන නිසා එයිනුත් සෑහෙන ආදායමක් මේ පලදවර්ධන කමිටුවට ලැබෙනවා. ප්‍රදේශයේ සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට රු. 30,000/- ක පමණ මුදලක් මේ අයුරින් පොතුහැර පලද වර්ධන කමිටුව උපයාගෙන තියෙනව.



**ගොවි ජනතාවගේ විශ්වාසය හා හොඳ හිත දිනා ගැනීම.**

ගොවි ජනතාවගේ හොඳහිත දිනා ගැනීමට නම් ඔවුන්ගේ ජීවන තත්වය වැඩි කරලීමට කටයුතු සැලසීම පලදවර්ධන කමිටුව සතු වගකීමක් ලෙස සළකන පොතුහැර පලද වර්ධන කමිටුව පළමුකොට ගොවීන්ගේ ආදායම වැඩි කරලීමේ මාර්ගයක් සලසා දුන්නා. එක් ගොවි කාරක සභා ප්‍රදේශයකින් කුඹුරු අක්කර 25 බැගින් තෝරා ගෙන ආදර්ශන යායවල් 11 ක් පසුගිය යල් කන්නයේ උහුමීය වෙල් යායේ වැඩ කිරීමට පලදවර්ධන කමිටුව ගොවීන්ගෙන් සහායක් ඇතිව කටයුතු කළා. එක් අක්කරයකින් වී බුසල් 25 ක් හෝ ලබා ගත නොහැකි වූ මෙම යායෙන් සාමාන්‍යයෙන් අක්කරයකට බුසල් 90 ක් පමණ එම ආදර්ශ කුඹුරු වලින් ලබා ගැනීමට පුළුවන්වූ බව පලදවර්ධන කමිටුවේ සභාපති මහතා ඇතුළු අනිකුත් සාමාජිකයෝ කියා සිටියා. උපකරණ හා මූලධනය අතින් වත්කමක් පොතුහැර පලද වර්ධන කමිටුවට තියෙන හෙයින් ගොවි ජනතාවගේ ජීවන තත්වය නන්වාලීමට සෑහෙන වැඩ කොටසක් ඉටු කිරීමට පොතුහැර පලදවර්ධන කමිටුවට හැකි වී තියෙනව.

මෙම පලදවර්ධන කමිටුවේ වැඩ කටයුතු සාර්ථක ලෙස කරගෙන යාමේ දී එහි කෘෂි සේවා මධ්‍යස්ථානයේ ලංකා බැංකුවේ කාර්ය මණ්ඩලයෙන් වටිනා සේවයක් ලැබී ඇති බව අපට පැහැදිලි වුනා. කුඹුරු ගොවිතැන සම්බන්ධයෙන් පමණක් නොව ගොඩ ගොවිතැන ගැනත් මේ පලද වර්ධන කමිටුව සැළකිල්ලක් දක්වා අවශ්‍ය පරිදි ගොවීන් හට උපදෙස් යනාදිය ලබා දී තියෙනවා. පලද වර්ධන කමිටුවේම මෙහෙයවීම යටතේ ගොවිපලක් පවත්වා ගෙන යාමට සෑහෙන ඉඩමක් ලබා දෙන්නේ නම් එය කමිටුවේත් ප්‍රදේශයේත් දියුණුවට කළ හැකි ලොකු උපකාරයක් බව මෙම පලද වර්ධන කමිටුවේ අදහසයි. ප්‍රාදේශීය සංවර්ධන වැඩකටයුතුවලදී පලද වර්ධන කමිටුවකට ඉටු කළ හැකි වටිනා සේවය කවරේද යන්න සෑහෙන තරමින් මෙම පලදවර්ධන කමිටුව ඔප්පු කර ඇති බව කියන්නට පිළිවනි.

